## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2018

---------------------------------------------------

## 1. මතය

-------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------------

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

----------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.9,961,979 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වලට බලපාන ගණුදෙනු පවතීනම් එයට අනුරූපව ගිණුම්කරණ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීමට පියවර ගනු ලබන බව දක්වා තිබුණි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුගතවිය යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂය තුලදී දායකයන් බඳවා ගැනීම වෙනුවෙන් ගෙවන ලද රු.4,069,526 ක් වූ දිරි දීමනා උපචිත දිරිදීමනා යටතේ ගැලපුම් නොකර සමාලෝචිත වර්ෂයේ සමාජ ආරක්ෂණ අරමුදලෙන් අයකර ගෙන තිබුණි. මේ නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | දිරි දීමනා ලෙස ගෙවූ රු.4,069,526.00 ක මුදල 2016 වර්ෂයේ බඳවාගැනීම් හා වාරික රැස්කිරීම් වලට ගෙවිය යුතු මුදලක් වූ අතර, එහි ගණනය කිරීම් සිදුකොට සත්‍ය වශයෙන් ගෙවීම් සිදු කරන ලද්දේ 2018 වසරේදීය. 2017 අවසන් ගිණුම් පිළියෙළ කරන අවස්ථාවේදී මෙය උපචිත වියදමක් ලෙස හඳුනාගෙන නොතිබූ බැවින්ද, වෙනත් පාර්ශවයකට ගෙවිය යුතුව තිබූ මුදලක් බැවින් 2017 වසරේ සත්‍ය වියදමක් ලෙස සලකා ගෙවීම් සිදු කරන ලද බව දක්වා තිබුණි. | වියදම් හඳුනාගැනීමේදී වියදම අදාල වන කාලපරිච්ඡේදය නිවැරදිව නිශ්චය කර ඒ අනුව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | | | |
| (අ) | උපචිත දිරි දීමනා | 1,794,756 | සමාලෝචිත වර්ෂයයේදී උපචිත දිරි දීමනා වශයෙන් රු.1,794,756 ක් මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර තිබුණද එම ගෙවිය යුතු පුද්ගලයින්ගේ නම්, මුදල හා අනෙකුත් විස්තර ඇතුලත් විස්තරාත්මක නාම ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන නොතිබුණි. | මෙම ශේෂය අධිවෙන් කිරීමක් ලෙස හඳුනාගත් අතර, 2019/242/5 අධක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් මෙය අවසන් ගිණුම් වලින් ඉවත් කිරීමට පියවර ගෙන ඇති බව දක්වා තිබුණි. | මෙවැනි වෙන්කිරීම්වල අවශ්‍යතාවය හඳුනාගෙන වෙනස්කම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දිරිදීමනා | 9,439,135 | සමාලෝචිත වර්ෂයේදී දිරිදීමනා වශයෙන් රු.9,439,135 ක් ගෙවීම් කර තිබුණද, එම මුදල් ලබාගත් බවට අදාල පුද්ගලයන්ගෙන් ලිඛිත සාක්ෂි ලබාගෙන නොතිබුණි. | මෙම මුදල් ගෙවීම් වාර්තාවක්ද සමඟ ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් වෙත යොමු කර ඇති බව දක්වා තිබුණි. | මුදල් ගෙවීමේදී නියමිත පුද්ගලයාට නියමිත මුදල ගෙවන ලද බවට සහතික කරගත යුතුය. |

### 1.5.5 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ඉවත්ව ගිය නිලධාරීන් 28 දෙනෙකුගෙන් රු.441,146 ක් ලැබිය යුතුව තිබුණු අතර ඒ තුළ වර්ෂ 06 ට වඩා වැඩි ශේෂයන් 05 ක් පැවතිණි. | ලැබිය යුතු මුදල් 2012 වසරේ සිට 2016 දක්වා විහිදී යන අතර, 2018 වසරේදී මෙය වෙන් වෙන්ව හඳුනාගත් අතර, තවදුරටත් අය කර ගත හැකි ශේෂයන් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන ඇත. එහි ප්‍රගතිය ද සලකා කිසිසේත් අය කර ගැනීමට නොහැකි මුදල් සඳහා ඉදිරි කටයුතු කළයුතු ආකාරය සඳහා උපදෙස් ලබා ගැනීමට අධක්ෂ මණ්ඩලයට යොමු කරන බව දක්වා තිබුණි. | මණ්ඩලය විසින් අයකරගත යුත ශේෂ අප්‍රමාදව අයකර ගත යුතුය. |

### 1.5.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනත 15 (2) වගන්තිය අනුව ප්‍රතිලාභ අහිමි වී ඇති විට ඒ බව මණ්ඩලය විසින් එම දායකයාට දැන්විය යුතුය. 2014 දෙසැම්බර් 31 දිනට පැවති පද්ධතිය අක්‍රියවූ දිනට අක්‍රීය දායකයන් සංඛ්‍යාව 288,234 ක් විය. එහෙත් 2015 වර්ෂයේ සිට 2019 මාර්තු දක්වා අක්‍රීය දායකයන් හඳුනාගැනීමට පද්ධතිය නොමැතිවීම නිසා එම දායකයන් වෙත ඒ පිළිබඳ දැනුම් දීමටද නොහැකිවී තිබුණි. | 2014 වර්ෂයේ සිට පරිගණක පද්ධතියේ Monthly Run යන ක්‍රියාකාරීත්වය සිදු නොවීම හේතුවෙන් අක්‍රිය දායක ලේඛන ලබාගැනීමේ හැකියාවක් නොමැති වීම මත එක් එක් සාමාජිකයන් වෙත අක්‍රිය නිවේදන නිකුත් කිරීමට නොහැකිවී ඇති බව දක්වා තිබුණි. | මණ්ඩලයේ ප්‍රධාන කාර්යය මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම වන නිසා මේ පිළිබඳ දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1999 අංක 33 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනත 6 අ (1) වගන්තිය ප්‍රකාරව සමාජ ආරක්ෂණය, සමාජ සුභසාධනය, රක්ෂණය, ආයු ගණක තක්සේරුව, පරිපාලනය, මුදල් හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති හෝ හැකියාවන් පෙන්නුම් කර ඇති තැනැත්තන් අතරින් නව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත කාර්මික උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය. 2017 වර්ෂයෙන් පසුව කමිටුව පත්කර නොතිබුණි. | පනතේ සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි තාක්ෂණික කමිටුවක් පත්කිරීමට නියමිතව ඇති බව දක්වා තිබුණි. | මෙම කමිටුව මගින් ආයතනයේ පරමාර්ථ ඉටුකර ගැනීමට සහායක් ලැබෙන බැවින් අප්‍රමාදව කමිටුව පත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,126,602 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,714,627 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,552,025 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 25 ක සහ සෘජු බඳවාගැනීම් යටතේ "සුරැකුම" සහ "ආරක්ෂාව" සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම 02 සඳහා පුද්ගලයන් 82,836 ක් බඳවාගෙන තිබුණද, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය දැනුවත් කිරීම නිසි පරිදි සිදුනොවීම හේතුවෙන් පොළොන්නරුව, රත්නපුරය, කොළඹ සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල වර්ෂය තුළ මුළු බඳවාගැනීම දායක සංඛ්‍යාව 500 ට වඩා අඩු මට්ටමක පැවතිණි. | සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල ඉතිහාසයේ ඉහළම සාමාජික බඳවාගැනීම් සංඛ්‍යාව වාර්තා කිරීමට හැකිවිය. එසේ වුවත් නිරීක්ෂිත කොළඹ, රත්නපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල ප්‍රගතිය ඉතා පහත් මට්ටමක පවතින අතර, එම ප්‍රගතිය වර්ධනය කිරීම සඳහා අනුයුක්ත කර ඇති සම්බන්ධීකරණ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති අතර, ප්‍රධාන කාර්යාලයට කැඳවා අවවාද කිරීම් ද සිදුකර ඇත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය පමණක් යම් ප්‍රගතියක් පෙන්වීමට සමත් වී ඇත | සම්බන්ධීකරණ නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම මෙන්ම ඒ සම්බන්ධව පසුවිපරම් සිදුකිරීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ සමස්ථ සාමාජිකයන් 82,836 ක් බඳවාගෙන තිබූ අතර එයින් පළමු මාස 11 තුල බඳවාගත් මුළු දායකයන් සංඛ්‍යාව 40,313 ක්වූ අතර දෙසැම්බර් මාසයේදී පමණක් 40,028 ක් බඳවාගැනීමට කටයුතු කර තිබුණි. ඉකුත් වර්ෂයේද මෙම තත්ත්වය ඇතිවී තිබීම හේතුවෙන් 2018 ජනවාරි 11 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අවධානය යොමු කර තිබූ අතර මෙම තත්ත්වය ගැටළු රැසකට | සාමාජිකයින් බඳවාගැනීමේදී වර්ෂයේ අවසන් කාර්තුව තුල වැඩි සංඛ්‍යාවක් බඳවාගැනීමේ ගැටළුකාරී තත්වය පිළිබඳ දිගින් දිගටම අවධානය යොමුකර ඇති අතර, සියළු දිස්ත්‍රික් නිලධාරීන් ලිඛිතව දැනුවත් කර ඇති බව දක්වා තිබුණි. | සාමාජිකයින් බඳවාගැනීමේදී තරඟකාරිත්වය සැළකීමට වඩා දායකයා වාරික ගෙවීම අඛණ්ඩ තත්ත්වයේ පවත්වාගෙන යාම පසුවිපරම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවන බවත්, වර්ෂයේ මුල් කාර්තුව තුළ සාමාජිකයින් දැනුවත් කර අදාළ උපදෙස් ලබාදිය යුතු බවත් දක්වා තිබුණි. කෙසේ වුවද ඒ පිළිබඳව අවධානය යොමු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ද එම තත්ත්වය ඇතිවී තිබුණි. | | |
| (ඈ) | 2018 වර්ෂයේ ජනවාරි 11 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අක්‍රිය සාමාජිකයින් සක්‍රීය කිරීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණද, එහි ප්‍රගතිය 2019 මැයි මාසය වනවිටත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී (2018) අක්‍රිය දායකයින් සක්‍රිය කිරීමේ නියමු ව්‍යාපෘතිය නුවරඑළිය දිස්ත්‍රික්කය පාදක කොටගෙන සිදු කිරීමට නියමිතව තිබූ අතර එහි යම් කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. වර්තමානය වන විට ග්‍රාම නිලධාරින් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් ඉවත් වී ඇති බැවින් තව දුරටත් එහි කාල ප්‍රමාදයක් ඇති වී තිබූ බව දක්වා තිබුණි. | අදාල වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම කළමනාකරණයේ වගකීමවේ. |
| (ඉ) | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකයින් බඳවා ගෙන තිබුණු අතර එම දායකයින් වාරික මුදල් නිසි පරිදි ගෙවීම් සිදුවේද යන්න සහ දායක මුදල් ගෙවීම පිළිබඳ දායකයන් වෙත නිවේදන / සිහි කැඳවීම් යැවීම් සහ වාරික අයවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ කටයුතු දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින්ගේ රාජකාරි පැවරුමට ඇතුලත් කරද තිබුණි. එසේවුවත් ඔවුන් ඒ අනුව කටයුතු කර දායකයන් අක්‍රීය තත්ත්වයට පත්වීම අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිගණක පද්ධතියෙන් අක්‍රිය සාමාජික ලේඛන නිවැරදිව ලබාගැනීමේ නොහැකියාව මත ඉටුකිරීමට නොහැකිවී ඇත. නව පද්ධතිය සකස් කිරීම සමඟ 2019 වර්ෂයේ අවසානයේ සිට ආරම්භ කරනු ලබන බව දක්වා තිබුණි. | මණ්ඩලයේ පරිගණක පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කඩිනම්ව සිදුකර දායකයන් අක්‍රීය තත්ත්වයට පත්වීම අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙතින් කලාකරුවනට සමාජ ආරක්ෂණ ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපක් ලබාදීමට 2016 වර්ෂයේදී රු.29,000,000 ක්ද, 2017 වර්ෂයේදී රු.65,000,000 ක් වශයෙන් රු.94,000,000 ක් මණ්ඩලය වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද, එම අරමුදල් මගින් කලාකරුවනට විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කර නොතිබුණු අතර එම මුදල් | 2016 සහ 2017 වර්ෂ තුල පිළිවෙලින් රු. 29,000,000 ක් සහ රු.65,000,000 ක් මණ්ඩලය වෙත ලබාදී ඇත. මෙම මුදල් ආයෝජනය කිරීමෙන් වාර්ෂිකව ලැබෙන පොළී ආදායමෙන් මෙම රු.50,000 වෙන්කරනු ලැබේ. එසේ වෙන්කල මුදල අදාළ කලාකරුවන්ගේ නමින් තැන්පත් කරන අතර, ඒ මත උපයන මුළු මුදල කලාකරුවා විශ්‍රාම ලබන | මණ්ඩලය විසින් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ආයෝජනය කර ආදායම උපයාගැනීම පමණක් සිදුකර තිබුණි . ඒ අනුව ලබාදී තිබුණු මුදලින් අවශ්‍ය සේවාව සඳහා යෙදවීමට වර්ෂ 02 තුලදීම කටයුතු කර නොතිබුණි. | අවස්ථාවේදී සම්පූර්ණ මුදලක් වශයෙන් ගෙවනු ලැබේ. ගිවිසුමේ පරිදි අදාල මුදල් ආයෝජනය කර ඇත. මේ වන විට යෝජනා ක්‍රමය සඳහා කලාකරුවන් 113 දෙනෙකු සාමාජිකවී අතර ඒ වෙනුවෙන් නියමිත පරිදි මුදල වෙන්කර ඇති බව සඳහන් කර තිබුණි. | |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 3 ක කාලයක් තුළ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් රු.12,511,000 ක් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් කළමනාකරණ තොරතුරු පද්ධතියක් මිළදී ගැනීම සඳහා භාණ්ඩාගාරය දැනුවත් කර රඳවාගෙන තිබුණි. කෙසේවුවද මෙම පරිගනක පද්ධතිය වර්ෂ 03 ක සිට මිළදී නොගැනීම නිසා ප්‍රතිපාදිත මුදල ඌණ උපයෝජනය වී තිබුණි. | 2016 වර්ෂය වන විට නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීමට අදහස් කර තිබූ බැවින්, මහ භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් රු. 2,497,000ක මුදලක් රඳවා ගන්නා ලදී. 2017.10.20 දින අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබුණු අතර 2017 වර්ෂයේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ඒ වන විට ප්‍රාග්ධන ප්‍රතිපාදන රඳවාගෙන තිබුයේ 2016 වර්ෂයේ ලැබුණු ප්‍රතිපාදන පමණි. 2017 වර්ෂයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භව තිබූ හෙයින් එම වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදල් ද තබා ගන්නා ලදී. 2018 වර්ෂයේ එපික් ලංකා ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කරන ලද බැවින් ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා 2018 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන තබා ගත් අතර, මෙම මුදල් තුළින් පළමු සැපයුම් කට්ටලය සඳහා මුළු මුදලින් 10%ක මුදල 2019.02.14 දින එපික් ලංකා ආයතනය වෙත ගෙවීම් සිදු කල අතර, දෙවන සැපයුම් කට්ටලය සඳහා ගෙවීම ඉදිරියේ දී සිදු කිරීමට නියමිත බව දක්වා තිබුණි. | එම කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටුකිරීමට සැළසුම්කර භාණ්ඩාගාර ප්‍රතිපාදන ඌණ උපයෝජනයවීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් ඌන උපයෝජනය

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිළිබඳව ප්‍රචාරක කටයුතු වෙනුවෙන් කෙටි වාර්තා චිත්‍රපටි දෙකක් 2014 වර්ෂයේදී සකස්කර ප්‍රචාරණය කිරීමට රු.824,000 ක් වියදම් කර භාෂාත්‍රයෙන්ම සංයුක්ත තැටි 6500 ක් සකස් කර තිබුණි. කෙසේවුවද, ඉකුත් වර්ෂ වලදී එම සංයුක්ත තැටි නියමිත පරිදි බෙදා නොහැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වනවිට එයින් 4762 ක් නිකුත් කිරීමට නොහැකිව ගබඩාවේ වර්ෂ 05 ක කාලයක් නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | එහි අභ්‍යන්තර සංයුතිය වර්තමානයේදී ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතින අතර, 2015 වසරෙන් පසු එම DVD පට නිකුත් කිරීමට ගබඩාව වෙත ඉල්ලීම් ලැබී නොමැති බව දක්වා තිබුණි. | ප්‍රචාරණ කටයුත්තක් සිදුකිරිමේදී එහි අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කර වැඩ සටහන් සකස් කළ යුතුය. |

## 3.4 ආර්ථික නොවන ගනුදෙනු

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් අවශ්‍ය අරමුදල් වෙන්කර ගැනීමකින් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව හා රජයේ තක්සේරුව වූ රු.165,000,000 ක මුදල ඉක්මවා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමට විශ්‍රාම වැටුප් අරමුදලින් රු.195,000,000 ක් වැයකර 2013 වර්ෂයේදී ගොඩනැගිල්ලක් මිලට ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය වනවිට ගොඩනැගිල්ල මිළදීගෙන වර්ෂ 05 ක් ගතවී තිබුණද මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර මුදල් ගෙවීමට සම්බන්ධව වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගෙන නොතිබුණි. | ගොඩනැගිල්ල මිලදී ගැනීමට අදාළ මිල ගණන් කැඳවීම, තාක්ෂණික කමිටු පත් කිරීම, කමිටු නිර්දේශ ලබා ගැනීම, අනුමැතිය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත යොමු කිරීම ආදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කටයුතු නිවැරදිව සිදු කළද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු බව දක්වා තිබුණි. | ගොඩනැගිල්ල මිළදී ගැනීම් සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත්නම් අදාළ වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන වැඩිපුර ගෙවීම අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

3.5 **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් කළමනාකරණ තොරතුරු පද්ධතියක් මිළදී ගැනීම සඳහා 2018 වර්ෂය වනවිට රු.12,511,000 ක් ප්‍රතිපාදන සළසාගෙන තිබුණි. මණ්ඩලය විසින් විධිමත් ලෙස ප්‍රසම්පාදනය සිදුකර සමාලෝචිත වර්ෂයේදී සැපයුම් ආයතනයක් තෝරා ගෙන ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ජුනි මාසයේ සිට පද්ධති සකස් කිරීම ආරම්භ කර තිබුණි. 2019 අගෝස්තු වනවිට මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය සැපයුම් කට්ටල 05 කින් සමන්විතව ආයතනයට භාරදීමට සැළසුම්කර කර තිබුණි. එම සැළැස්ම අනුව දෙසැම්බර් මාසයේ 14 වන දින පළමු සැපයුම් කට්ටලයද, දෙවන සැපයුම් කට්ටලය 2019 පෙබරවාරි 08 දින සහ තෙවන සැපයුම් කට්ටලය 2019 අප්‍රේල් 10 දින ලබාදීමත් ඒ අනුව අදාළ සැපයුම්කරු වෙත ගෙවීමත් සහ පද්ධතිය අධ්‍යයන කිරීමත් අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වුවද පළමු සැපයුම් කට්ටලය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 24 වන දින භාරදී තිබුණු අතර 2019 මැයි 03 වන දිනය වන විටත් දෙවන සහ තෙවන සැපයුම් කට්ටල ලබාගැනීමට මණ්ඩලය අපොහොසත්වී තිබුණි. | මේ වන විට දෙවන සැපයුම් කට්ටලයට අදාළව විස්තරාත්මක පද්ධති අවශ්‍යතා පිරිවිතරයන් සකස් කිරීම හා අඩුපාඩු නිවැරදි කිරීම සිදුකරගෙන යන අතර, දෙවන සැපයුම් කට්ටලයේ 75% ක ප්‍රතිශතයක් මේ වන විට අවසන් ව ඇති අතර, ප්‍රමාදයට ලක්ව ඇති මෙම දෙවන සැපයුම් කට්ටලයට යම් අමතර කාලයක් ගත වුවද, එපික් ලංකා ආයතනය විසින් දෙවනුව ලබා දුන් කාල රාමුවේ මෘදුකාංග පද්ධතිය අප වෙත ලබා දීමට පොරොන්දු වූ දිනටම ලබා දීමට එපික් ලංකා ආයතනය විසින් කටයුතු යොදා ඇති බව වාචිකව අප වෙත දන්වා ඇති බව දක්වා තිබුණි. | මණ්ඩලය විසින් විසින් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් කළමනාකරණ තොරතුරු පද්ධතිය කඩිනමින් සකස් කර ඒ මගින් ආවරණය වන කටයුතු අප්‍රමාදව සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තනතුර 2018 ජූලි 15 දින සිට පුරප්පාඩුව පැවතුණ අතර සුදුසු අයෙකු පත් කරන තෙක් 2018 ජූලි 16 දින සිට රාජකාරි ආවරණය කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි පත්කර තිබුණි. එමෙන්ම මෙම තනතුරට බඳවා ගැනීම සඳහා 2018 සැප්තැම්බර් 25 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අයදුම්කරුවකු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබුණි. ආයතන සංග්‍රහයේ ii වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව වැඩ බැලීමේ පත්කිරීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් සහ අදාළ තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම නොපමාව කළ යුතුය. කෙසේ වුවද, සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගත් නිලධාරියා බඳවා නොගෙන මාස 09 ක්ම රාජකාරි ආවරණය කර ගෙන යමින් පැවතිණි. | දිගු කාලයක් මෙම තනතුර පුරප්පාඩුව පවතින හෙයින් මෙම තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් අතර, එම අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණි. | මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තනතුර වර්ෂයකට ආසන්න කාලයක් පවතින පුරප්පාඩුව අප්‍රමාදව බඳවා ගැනීම සිදුකල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරගත් පරිගණක ජාල සහකාර තනතුරු 01 ක්ද, කළමනාකරණ සහකාර තනතුරු 07 ක්ද, පොත් තබන්නා තනතුරු 01 ක් සහ සම්බන්ධීකරණ නිලධාරි තනතුරු 03 ක් පුරප්පාඩු වී තිබුණි. ඒ අනුව අනුමත කරගත් තනතුරු 12 ක් බඳවා ගැනීම්වල ප්‍රමාද තත්ත්වයන් හේතුවෙන් සමාජ ආරක්ෂණ කටයුතුවලටද බලපා ඇති බැව් විගණනයට නිරීක්ෂණය විය | 2018 දෙසැම්බර් වන විට පැවති පුරප්පාඩු සඳහා 2019.05.02 වන දින බඳවා ගැනීම් සිදු කරන ලදී. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද නව තනතුර වන පරිගණක ජාල සහකරු තනතුර සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇතත් එම තනතුරට අදාළ බඳවාගැනීමේ පරිපාටිය මෙතෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර අප වෙත ලැබී නොමැති හෙයින් බඳවාගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි ව ඇති බව දක්වා තිබුණි. | ආයතනයේ මෙහෙයුම් කටයුතුවලට බාධා නොවීමට අවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් අප්‍රමාදව බඳවා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016-2018 සහ 2017-2019 වර්ෂයන් සඳහා මණ්ඩලය විසින් සකස් කරන ලද සංයුක්ත සැළැස්මේ දුර්වලතා සහ බාධක වශයෙන් වූ කරුණු නැවත 2018 – 2020 වර්ෂය සඳහා සකස් කරන ලද සංයුක්ත සැළැස්මටද ඇතුළත් කර තිබුණි. ඉකුත් වර්ෂ 03 ක් ඇතුළතද මණ්ඩලයට මෙම ගැටළු සඳහා විසඳුම් ලබාගැනීමට අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි. | නව පරිගණක පද්ධතිය සකස් කිරීම් මේ වන විට ආරම්භ කර ඇති අතර, 2019 වර්ෂය අවසන් වන විට මෙම කටයුතු විධිමත්ව සිදුකිරීම ආරම්භ කළ හැකි බව දක්වා තිබුණි.. | සංයුක්ත සැළැස්මට ඇතුළත් කරන ලද කරුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ මූලික අරමුණු 04 ක් වූ අතර එයට උප ක්‍රියාකාරකම් 13 ඇතුළත් කර තිබුණි. එම කාර්යයවලින් සමාලෝචිත වර්ෂයේ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම හා සාමාජික ප්‍රවර්ධනය යටතේ භාහිර පාර්ශවයන් සමඟ ඒකාබද්ධ වැඩසටහන් ආරම්භ කිරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට නිළධාරියෙකු බැගින් බඳවා ගැනීම යටතේ නිළධාරින් 322 ක් බඳවා ගැනීම සහ ප්‍රතිලාභ හිමිගැන්වීම සරල විධිමත් හා කඩිනම් කිරීම යටතේ ප්‍රශස්ත වූ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම යන කාර්යයන් ඉටුකිරීමට නොහැකිවී තිබුණි. | කොන්ත්‍රාත් පදනම මත මෙම කාර්ය මණ්ඩලය බඳවාගැනීම සුදුසු නොවන බවත්, පුහුණු උපාධිධාරීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීමට යෝජිතව ඇති හෙයින් ඉන් නිලධාරීන් 350ක් අප මණ්ඩලය වෙත අනුයුක්ත කිරීමටත්, ගරු අග්‍රාමාත්‍යතුමා හා එවකට සිටි සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කොට උපදෙස් ලබා දී ඇත. තවද අපගේ ආයතනයේ විෂය පථය ඉතා පුළුල් සහ සංකීර්ණ බැවින් බලාපොරොත්තු වූ කාලයට වඩා වැඩි කාලයක් පද්ධති අධ්‍යනය සඳහා ගත වන බවයි. මේ අනුව ඉහත ප්‍රමාදයට හේතු සහිතව ඉදිරිපත් කරන ලද ලිපිය සමඟ නව ව්‍යාපෘති කාල රාමුවක් සකස් කර එවා ඇති බව දක්වා තිබුණි. | මණ්ඩලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මට වර්ෂය තුළ ඉටුකර ගත හැකි අරමුණු ඇතුළත් කිරීමට සහ ඇතුළත් කළ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් වියදම් අතර සියයට 03 සිට සියයට 85 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූ බැවින් සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. | මෙසේ සිදුවූයේ 2017 වසර සඳහා අනුමත ප්‍රතිපාදන වලින් කොටසක් මහා භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් නොවීම නිසා 2018 වර්ෂයේ ලද ප්‍රතිපාදන වලින්, 2017 ට අදාල වියදම් දරා ඇති නිසාය. එබැවින්, 2018 ට අදාළ වැය ශීර්ෂයන් හි රුපියල් මිලියන 130 ක ප්‍රතිපාදන වෙන් කොට පෙන්වූවද, සත්‍ය වශයෙන් වියදම් දරා ඇත්තේ 2017 ට අදාලව දැරූ වියදම් අඩුවී ලැබුණු ශේෂයටය. එම නිසා විචලනයන් පවතින බව දක්වා තිබුණි. | මණ්ඩලය අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් සහ වියදම් අතර විචලනයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |